සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

2025-01

Learning Resource Center
R
De Mazenod College
Kandana
16805

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

ශ්‍රේණිය / தரம் / Grade	07	විෂයය / பாடம் / Subject	චිත්‍ර කලාව	පත්‍රය / வினாத்தாள் / Paper	I, II	කාලය / காலம் / Time	පැය 2 යි

නම / பெயர் / Name .... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....

I පත්‍රය

ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් දී ඇති රූප සටහන් හඳුනාගෙන ඊට යටින් ඇති තිත්ඉරි මත ලියන්න.

01.

....

02.

....

03.

....

04.

....

05.

....

අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

06. හින්දු කෝවිලක ප්‍රධානම ගෘහ නිර්මාණ අංගය වන්නේ ,
    i අට්ටාල　　ii ගෝපුරම්　　iii විමාන　　iv කුළුණු

07. ශ්‍රී ලංකාවේ චෛත්‍යවල හතරැස් කොටුව යනුවෙන් හඳුන්වන අංගය ඉන්දියාවේ සාංචි ස්ථූපයේදී හඳුන්වන්නේ,
    i ප්‍රදක්ෂිණා පථය යනුවෙනි.　　ii මේදිය යනුවෙනි.　　iii හර්මිකාව යනුවෙනි.　　iv පද්මාකාර යනුවෙනි.

08. කඩුපුල් මල පාලි භාෂාවෙන් හඳුන්වනු ලබන්නේ,
    i දිව මහනෙල් යනුවෙනි.　　ii කිනිහිරියා යනුවෙනි.　　iii කකිරි මල යනුවෙනි.　　iv කුමුදුප්පල යනුවෙනි.

09. තල්කොල පැදුරු කර්මාන්තයේ දී නිදා ගැනීම සඳහා භාවිතා කළ පැදුරු හඳුන්වන්නේ,
    i කදිර්පායි යනුවෙනි　　ii පඩුක්කේයි පායි යනුවෙනි　　iii පන්දිප්පායි යනුවෙනි　　iv සෝට්ටුප්පායි යනුවෙනි

10. ජේතවන දාගැබේ තැන්පත් කර ඇත්තේ බුදුන් වහන්සේගේ,
    i පයි ධාතුවයි.　　ii ශාරීරික ධාතුවයි.　　iii දකුණු අකු ධාතුවයි.　　iv දන්ත ධාතුවයි.

අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට ඇතුළත් වගන්ති නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද, වරහන් තුළ යොදන්න.

11. ඉවතලන කඩදාසි, රෙදි කැබලි වැනි දෑ ඉරා හෝ කපා ඇලවීම ටෙම්ප්ලේට් ලෙස හැඳින්වේ. ( )

12. හින්දු භක්තිකයෝ "නන්දි ගවයා" ශිව දෙවියන්ගේ වාහනය ලෙස සලකති. ( )

13. අල්ප උන්නත කැටයමක් කිරීම සඳහා පහසුම මාධ්‍ය ලෙස සැජුෆෝම් යොදාගත හැකිය. ( )

14. බුද්ධාගම ලක්දිව ප්‍රතිෂ්ඨාපනය වීමෙන් පසු ඉදිවූ පළමු ස්තූපය ථූපාරාමය වේ. ( )

15. මූලික වර්ණ අතරට දම් වර්ණය අයත් වේ. ( )

අංක 16 සිට 20 තෙක් අසා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයන්න.

16. අභයගිරිය දාගැබේ පිවිසුම් දොරටුවෙහි, සඳකඩපහණ දෙපස පිහිටුවා ඇති බහිරව රූපයක් නම් කරන්න.

....

17. නියඳ කළාල හෙවත් නියඳ පැදුරු ප්‍රධාන කොටස් තුනකි. ඉන් එක් කොටසක් නම් කරන්න.

....

18. රන් කොත් වෙහෙර හතරැස් කොටුවේ, සෑම මුහුණතකම කැටයම් කර ඇත්තේ කුමන මල් කැටයමද ?

....

19. ඉස්ලාම් දේවස්ථාන පියස්සේ දක්නට ලැබෙන උල් වූ කුඩක් සහිත ගෝලාකාර වාස්තු විද්‍යාත්මක අංගය කුමක්ද?

....

20. වර්ණවත් විදුරුවලින් නිමවා ඇති වෘත්තාකාර කවුළු (Rose Window) දක්නට ඇත්තේ කිනම් වර්ගයේ ක්‍රිස්තියානි දේවස්ථානවලද ?

....

අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න වලට පහත සඳහන් රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.


A

B

C


D

E

21. A රූපයෙන් දැක්වෙන්නේ පැරණි චිත්‍ර ගුරුවරයා සිය ගෝලයාට ලබා දුන් පළමු අභ්‍යාසයයි. එය කුමක්ද ?

    ....

22. B රූපයෙන් දැක්වෙන සත්ව රූප 7 ක් ඇසුරෙන් නිර්මාණාත්මකව ගොඩනගන ලද මෝස්තර ඒකකය කුමක් ද ? ....

23. C රූපයෙන් දැක්වෙන නිර්ජීවී මෝස්තර ගණයට අයත් ඒකකය හඳුන්වන නම කුමක්ද ?

    ....

24. D රූපයෙන් දැක්වෙන ස්වභාවික උද්භිද ඒකකය නම් කරන්න. ....

25. E රූපයෙන් දැක්වෙන කල්පිත ගණයට අයත් උද්භිද මෝස්තරය නම් කරන්න. ....

පහත දැක්වෙන රූප සටහන හඳුනාගෙන අංක 26 සිට 30 තෙක් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



26. මින් දැක්වෙන රූකඩ වර්ගය කුමක්ද ? ....

27. මෙම කලාව ප්‍රචලිත ප්‍රදේශය කුමක්ද? ....

28. මෙම නිර්මාණ සඳහා යොදා යොදාගන්නා දැව විශේෂයක් නම් කරන්න ....

29. මෙම නිර්මාණ සඳහා යොදා ගන්නා ජාතක කතාවක් නම් කරන්න ....

30. රූපවාහිනී මාධ්‍ය තුළ ජනප්‍රිය රූකඩ වර්ගයක් නම් කරන්න ....

***

(ලකුණු 30)

II පත්‍රය

පහත දැක්වෙන "අ"කොටස අනිවාර්යයි.

"අ" කොටස

ගෝලය, සිලින්ඩරය, ඝනකාභය යන හැඩතල වලින් දෙකක් තෝරා ගෙන සම්පින්ඩනාත්මක රේඛා චිත්‍රයක් අඳින්න.

(ලකුණු 10)

"ආ" කොටස

පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරා ගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න .

01. සරුංගල් යවන ළමුන්
02. දිය බොන මුව රංචුවක්
03. පාසල් වත්ත පිරිසිදු කරන ළමුන්
04. චිත්ත රෙද්දකට සුදුසු මල් මෝස්තරයක්
05. ළමා ඇඳුමකට සුදුසු මෝස්තරයක්
06. ද්විතීක වර්ණ භාවිතයෙන් නිදහස් හැඩතල රටා ඇඳ වර්ණ කරන්න.
07. ක්‍රීඩා උත්සවයකට ආරාධනා පත්‍රයක් ඇඳ වර්ණ කරන්න.
08. පොත් පිට කවරයක් ඇද වර්ණ කරන්න.

(ලකුණු 60)

***